# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1415/17 – 2005 ඔක්තෝබර් 19 වැනි බදාදා – 2005.10.19

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

24 අ (1) වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, 44(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 අ වගන්තියේ (1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන් –

(1) කලා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යාපනය සැපයීමේ, ප්‍රවර්ධනය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා 2005 සැප්තැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් අධ්‍යයනය සඳහා වූ මධ්‍යස්ථානයක් පිහිටුවමි ; තවද

(2) එම මධ්‍යස්ථානයට " මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය " යන නාමය පවරමි.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

2005 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

11- 35/1

1A-G 006196- 1,010 (2005/10)

එල්. ඩී. බී. 21/78.

## 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වැනි වගන්තිය සමග කියවිය යුතු 24අ වගන්තිය යටතේ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන,
කොමිෂන් සභාව.

2005 සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

*නියමාවලිය*

1. මේ නියමාවලිය 2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා නියමාවලිය යනුවෙන් සඳහන් කරනු ලැබිය හැකි අතර එය 2005 සැප්තැම්බර් 01 දින සිට බලාත්මක වන්නේ ය.

2. මේ නියමාවලිය (මෙහි මින් මතු පනත යනුවෙන් සඳහන් කරන) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ ජනාධිපතිතුමිය විසින් සාදන ලද 2005.10.10 දින දරන නියමයෙන් සංස්ථාපනය කරන ලද (මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරන) ජාතික මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයන මධ්‍යස්ථානයට අදාළ වන්නේ ය.

3. 24අ වගන්තිය යටතේ කරන ලද ඉහත සඳහන් නියමය බලාත්මක වීමේ දී මධ්‍යස්ථානය එම නියමයෙන් ඊට දී ඇති නාමය සහ අභිධානය සහිතව අඛණ්ඩ පැවැත්මක් ඇති සහ එය විසින් හා එයට විරුද්ධව එම නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි සංස්ථාවක් වන අතර එයට පොදු මුද්‍රාවක් තබා ගැනීමට සහ භාවිතා කිරීමට ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කර ගැනීමට ද බලය ඇත්තේ ය.

4. මධ්‍යස්ථානයේ අරමුණු පහත දැක්වෙන පරිදි වේ :-

(1) ජාතික මට්ටමේ සහ විශේෂයෙන් විශ්ව විද්‍යාල පද්ධතිය ඇතුළත, මධ්‍යස්ථානයේ විෂයය පථයට ඇතුළත් ක්ෂේත්‍රවල, විපරාවර්තනීය චින්තනය හා නූතන මත දිරිගැන්වීම හා පරිපෝෂණය සහ නිර්මාණ කෞශල්‍යය හා ප්‍රතිභාව ආවේණික ලක්ෂණයක් වන පර්යේෂණවලට රුකුල් දීම ;

(2) නව දැනුම හා පුරෝගාමී මත උකහා ගැනීමේ ජාතික සාමාර්ථය ගොඩනැගීමට දායක වීම ;

(3) ජාත්‍යන්තර කීර්තියක් සහිත සමාන අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානවල අනුරූප ක්ෂේත්‍රවල ඉදිරිපත් කෙරෙන සංසන්දනීය මට්ටමේ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ජාතික හා විදේශීය විශ්ව විද්‍යාලවල සහ විශ්ව විද්‍යාල වලින් බාහිර විද්වතුන්ගේ හා වෙනත් විශේෂඥයන්ගේ අධීක්ෂණය හා මාර්ගෝපදේශකත්වය යටතේ ඉඩ ප්‍රස්ථා සැපයීම ;

(4) මධ්‍යස්ථානයේ විෂයය පථයට අයත් ක්ෂේත්‍රවල මානව සම්පත් උත්පාදනයට සහ ශාස්ත්‍රීය හා වෘත්තීය විශේෂඥතා වැඩිදියුණු කිරීමෙහි ලා දායක වීම ;

(5) මධ්‍යස්ථානයේ විෂයය පථයට අයත් ක්ෂේත්‍රවල අලුතින් බිහිවන ශාස්ත්‍රීය හා වෘත්තීය ප්‍රජාවේ අවශ්‍යතා සහ දක්ෂතා අනුව කටයුතු සම්පාදනය කිරීම ;

5. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව මධ්‍යස්ථානයට පහත දැක්වෙන බලතල හා කර්තව්‍ය ඇත්තේ ය.

(1) මධ්‍යස්ථානයට එහි අරමුණු ඉටුකර ගැනීමෙහි ලා උපදෙස්දීම සහ සහායවීම පිණිස, මධ්‍යස්ථානයේ සාමාජිකයන් බවට පත්වන හා ගරු තරාතිරමින් සේවය කරන ආශ්‍රිත සාමාජිකයන් හා ජ්‍යෙෂ්ඨ ආශ්‍රිත සාමාජිකයන් පත්කිරීම ;

(2) ජ්‍යෙෂ්ඨ ආශ්‍රිත සාමාජික සංසදය යනුවෙන් එක්ව සඳහන් කරනු ලබන ජ්‍යෙෂ්ඨ ආශ්‍රිත සාමාජිකයන්ට අන්‍යෝන්‍යව හා ඒකාබද්ධව ක්‍රියා කිරීමට හැකිවන සේ වරින්වර හමුවීම් පැවැත්වීම ;

(3) පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂණ ප්‍රතිපාදන මගින් නඩත්තු කරන පර්යේෂක අධිශිෂ්‍යත්වධාරීන් සහ පර්යේෂණ ශාස්ත්‍රධරයන් කලින් කල පත් කිරීම ;

(4) යම් අනුමත කළ අධ්‍යයන අංශවල පශ්චාත් උපාධි පාඨමාලා ඇතුළුව අධ්‍යයන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ඒ පාඨමාලා සඳහා අපේක්ෂකයන් තෝරාගෙන ඇතුළත් කර ගැනීම ;

(5) විභාග පැවැත්වීම ;

(6) මධ්‍යස්ථානයෙහි අනුමත කළ පාඨමාලා හදාරා, මධ්‍යස්ථානයෙහි අතුරු ව්‍යවස්ථා මගින් නියමිත විභාග සමත් තැනැත්තන්ට උපාධි, අභිඥාන පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම ;

(7) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බාහිර වෙනත් විශ්ව විද්‍යාල හෝ ආයතන සමග ආචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීම සඳහා සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(8) මධ්‍යස්ථානයේ පාලක සභාවේ නිර්දේශය මත රිජන්ට් කවුන්සිලය අනුමත කරන තැනැත්තන්ට සම්මාන උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනැමීම ;

(9) විනය පාලනය සහ මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ ආශ්‍රිත සාමාජිකයන්, ආශ්‍රිත සාමාජිකයන්, පර්යේෂක ශිෂ්‍යයන් සහ සේවකයන්ගේ ශුභසාධනය සඳහා විධිවිධාන සැලැස්වීම ;

(10) ගාස්තු අයකිරීමට අදාළ යම් නියෝග හෝ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ගාස්තු අය කිරීම ;

(11) මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු යම් කාලසීමාවක් සඳහා, මධ්‍යස්ථානයේ අරමුණු, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්මක් දැක්වෙන සංස්ථා සැලැස්මක් සකස් කිරීම ;

(12) මධ්‍යස්ථානයේ සේවා නියුක්තයන් පුහුණු කිරීමේ වැඩසටහන් හා අනුස්ථාපන වැඩසටහන් පවත්වීම ; සහ

(13) මධ්‍යස්ථානයේ අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

6. මධ්‍යස්ථානයේ බලමණ්ඩලය පහත සඳහන් ආයතන වලින් සමන්විත විය යුතු ය :-

(අ) රිජන්ට් කවුන්සිලය ;

(ආ) කළමනාකරණ සභාව ;

(ඇ) ශාස්ත්‍රීය කමිටුව සහ අධ්‍යයන මණ්ඩලය ;

7. (1) රිජන්ට් කවුන්සිලය, මධ්‍යස්ථානයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදක මණ්ඩලය සහ පාලක බල මණ්ඩලය වන්නේ ය.

(2) රිජන්ට්ස් කවුන්සිලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) රජයේ ප්‍රධානයා ;

(ආ) කොමිෂන් සභාවේ සභාපතිවරයා ;

(ඇ) කළමනාකරණ සභාවේ සභාපතිවරයා ;

(ඈ) අධ්‍යක්ෂවරයා ;

(ඉ) ප්‍රමුඛ හෝ ප්‍රධාන ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රය කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, නීතිය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රයකට අයත් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ, මණ්ඩප හෝ අධ්‍යයන ආයතන ඇතුළුව යම් පීඨයක පීඨාධිපති, අධ්‍යක්ෂ හෝ මණ්ඩපාධිපති ;

(ඊ) උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව විසින් නම් කරනු ලබන මේ ඡේදයේ වෙනත් අනුඡේද යටතේ රිජන්ට් කවුන්සිලයක සාමාජිකයන් නොවන, උපකුලපතිවරුන් සිව් දෙනෙක් ; මොවුන් සෑම අවුරුදු තුනකට වරක් විශ්ව විද්‍යාල අතර වටමාරු කරනු ලැබේ ;

(උ) කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, නීතිය, අධ්‍යාපනය හෝ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රවල විශිෂ්ඨතා සහිත තැනැත්තන් අතරින් කළමනාකරණ සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයන් සිව් දෙනෙක් ;

(ඌ) කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, නීතිය, අධ්‍යාපනය හෝ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රවල විශිෂ්ඨතා සහිත තැනැත්තන් අතරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් සිව් දෙනෙක් ;

(එ) ආශ්‍රිත ජ්‍යෙෂ්ඨ සාමාජික සංසදය විසින් කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, නීතිය, අධ්‍යාපනය හෝ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයක විශිෂ්ඨතා දරන තැනැත්තන් අතරින් පත් කරනු ලබන සාමාජිකයන් සිව් දෙනෙක් ; එසේ වුව ද මෙහි සඳහන් ප්‍රථම සාමාජිකයන් සිව් දෙනා අවුරුදු තුනක කාලසීමාවක් සඳහා හෝ ආශ්‍රිත ජ්‍යෙෂ්ඨ සාමාජික සංසදය රීජන්ට්ස් කවුන්සිලයේ ප්‍රථම රැස්වීමේ සිට අවුරුදු දෙකකට අඩු නොවන කාලයකට පසුව යථා පරිදි සංස්ථාගත කළ යුතු ජ්‍යෙෂ්ඨ ආශ්‍රිත සාමාජික සංසදය සංස්ථාපනය කරන තෙක් යන මෙයින් කලින් එළඹෙන දිනය දක්වා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ ;

(3) රජයේ ප්‍රධානයා රීජන්ට් කවුන්සිලයේ සභාපතිවරයා විය යුතු අතර රීජන්ට් කවුන්සිලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. රජයේ ප්‍රධානයාට යම් රැස්වීමක මුලසුන දැරීමට නොහැකි වුවහොත් ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතරින් සාමාජිකයකු තෝරා පත්කර ගත යුතු ය.

(4) (5) වන අනු ඡේදයේ විධිවිධානවලට යටත්ව, රීජන්ට් කවුන්සිලයේ යම් පත්කළ හෝ නම්කළ සාමාජිකයකු ඔහු කලින් ධූරය අත්හළහොත් මිස, ඔහුගේ පත්වීමේ හෝ නම් කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතු අතර, ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත් කරනු ලැබීමට හෝ නම් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

යම් පත්කළ හෝ නම් කළ සාමාජිකයකු ඔහුගේ ධූර කාලය ඉකුත්වීමට ප්‍රථම ධූරය අත්හළහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා ද නියමිත ධූරකාලයට කලින් ධූරය අත්හැරියහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරි කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

(5) රීජන්ට් කවුන්සිලයේ කවර හෝ පත්කළ හෝ නම් කළ සාමාජිකයකු විසින් ඔහු නම් කළ පුද්ගල මණ්ඩලයට පිටපතක් සහිතව මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා අමතා යවන ලිපියක් මගින් ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) රීජන්ට් කවුන්සිලයේ යම් පත්කළ හෝ නම්කළ සාමාජිකයකු රීජන්ට් කවුන්සිලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට කවර හේතුවක් නිසා හෝ නොපැමිණියහොත් ඔහු රීජන්ට් කවුන්සිලයේ සාමාජික ධූරය අත්හල ලෙස සැලකිය යුතු අතර අවස්ථාවෝචිත පරිදි, පත්කිරීම හෝ නම් කිරීම සිදු කළ පුද්ගල මණ්ඩලය විසින් එසේ ධූරය අත්හළ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කිරීම හෝ නම් කිරීම කළ යුතු ය.

(7) රීජන්ට්ස් කවුන්සිලයේ පත්කල හෝ නම්කළ සාමාජිකයන්ට කොමිෂන් සභාව අනුමත කරන යම් පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් සඳහා හිමිකම ඇත.

(8) රීජන්ට්ස් කවුන්සිලයේ රැස්වීමක් සඳහා ගණපූරණය එහි මුළු සාමාජිකත්වයෙන් තුනෙන් එකක සංඛ්‍යාවක් විය යුතු ය.

(9) රීජන්ට්ස් කවුන්සිලය අවශ්‍ය කවර අවස්ථාවක වුව ද රැස්විය හැකි ය ; එසේ වුව ද එක් ලිත් වර්ෂයකට යටත් පිරිසෙයින් දෙවතාවක් රැස්විය යුතු ය.

(10) අවශ්‍ය යයි තමන් සලකන කවර හෝ අවස්ථාවක, නැතහොත් රීජන්ට්ස් කවුසිලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකින් සභාපතිවරයා වෙත ලිඛිත ඉල්ලීමක් ලැබී සතියක් ඇතුළත රීජන්ට්ස් කවුන්සිලයේ සභාපතිවරයා විසින් කවුන්සිලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

8. මධ්‍යස්ථානයේ ලේඛකාධිකාරිවරයා රීජන්ට්ස් කවුන්සිලයේ ලේකම්වරයා විය යුතු ය.

9. මධ්‍යස්ථානය වෙත පැවරී හෝ නියම වී ඇති හෝ මධ්‍යස්ථානයට භාරකර ඇති බලතල කාර්ය හෝ කර්තව්‍ය, රීජන්ට්ස් කවුන්සිලය විසින්, මේ නියමාවලියේ විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කළ යුතු ය.

10. 5 වන ඡේදයෙන් කවුන්සිලය වෙත පැවරී ඇති බලතලවලට අගතියක් නොමැතිව, මෙහි පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය, කවුන්සිලය විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කළ යුතු ය.

(අ) මධ්‍යස්ථානය සඳහා කුළ ලාංඡනයක් සහ පොදු මුද්‍රාවක් තෝරා ගැනීම සහ ස්වකීය අභිමතය පරිදි ඒවා වෙනස් කිරීම ;

(ආ) කළමනාකරණ සභාව නිර්දේශ කරන තැනැතන්ට සම්මාන උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම ;

(ඈ) ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දී ඇති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීම ;

(ඇ) ක්‍රියාවේ යෙදීම සම්බන්ධයෙන් මේ නියමාවලියේ හෝ වෙනත් යම් සාධන පත්‍රයක හෝ අන්‍යාකාරව විධිවිධාන සලසා නොමැති මධ්‍යස්ථානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම හා සම්බන්ධයෙන් ක්‍රියාවේ යෙදිය යුතු මධ්‍යස්ථානයේ වෙනත් සියලු බලතල ක්‍රියාවේ යෙදීම ;

(ඉ) යම් ශාස්ත්‍රීය, මූල්‍ය හෝ පරිපාලන කාරණයක් හා සම්බන්ධව, කළමනාකරණ සභාව විමසා යම් යෝජනා සම්මත කිරීම

11. (1) කළමනාකරණ සභාව, මධ්‍යස්ථානයේ පරිපාලන හා ශාස්ත්‍රීය බලමණ්ඩලය වන්නේ ය.

(2) ප්‍රථම කළමනාකරණ සභාව කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු අතර එය මේ නියමාවලියේ දින සිට එක් අවුරුද්දක කාලසීමාවක් හෝ II(3) ඡේදයේ නිශ්චිතව සඳහන් කළමනාකරණ සභාව පත්කරන තෙක් අතුරු කළමනාකරණ සභාව ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

(3) කළමනාකරණ සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :-

(i) අධ්‍යක්ෂවරයා ;

(ii) ස්වකීය ප්‍රධාන ශාස්ත්‍රීය අධ්‍යයන විෂයය ක්ෂේත්‍රයට කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, නීතිය සහ අධ්‍යාපනය ඇතුළත් උපාධි අධ්‍යයන පීඨ, මණ්ඩප හෝ විද්‍යායතන ඇතුළුව යම් පීඨයක පීඨාධිපති, අධ්‍යක්ෂ හෝ මණ්ඩපාධිපති ;

(iii) මධ්‍යස්ථානයේ එක් එක් අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා ;

(iv) අදාළ විෂයය ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවක් දරන තැනැත්තන් අතරින් කොමිෂන් සභාව විසින් පත් කරන සාමාජිකයන් සිව් දෙනෙක්.

(4) කොමිෂන් සභාව විසින්, කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, නීතිය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල විශිෂ්ඨත්වය දරන තැනැත්තන් අතරින්, කළමනාකරණ සභාවේ සභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(5) පත් කරනු ලැබූ සෑම සාමාජිකයකුම, පත්කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

පත්කළ සාමාජිකයකු විශ්‍රාම ලැබූ හෝ ඉල්ලා අස්වූ හෝ රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ සහ කළමනාකරණ සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණීමට නොහැකි වීමේ හේතුවෙන් අන්‍යාකාරව ධුරය අත්හළ අවස්ථාවක ඔහු වෙනුවට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර ඒ තැනැත්තා අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයේ නොගෙවී ඉතිරි කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

(6) කළමනාකරණ සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකක් විය යුතු ය.

(7) මධ්‍යස්ථානයේ අධ්‍යාපනය, පර්යේෂණ සහ විභාග පරිපාලනය හා පැවැත්වීම පිළිබඳ පොදු පාලනය සහ විධානය, කළමනාකරණ සභාව සතු විය යුතු ය.

(8) පනතේ විධිවිධානවලට යටත්ව සහ II (7) ඡේදයෙන් කළමනාකරණ සභාව වෙත පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, කළමනාකරණ සභාව විසින් පහත දැක්වෙන බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කළ යුතු ය :-

(අ) මධ්‍යස්ථානයේ ලේඛකාධිකාරිවරයා භාරයේ තිබිය යුතු මධ්‍යස්ථානයේ පොදු මුද්‍රාව භාවිතා කළ යුතු ආකාරය පිළිබඳ විධාන දීම සහ එම මුද්‍රාව මධ්‍යස්ථානයේ ලේකම්වරයා සහ ලේඛකාධිවරයා ඉදිරියේ දී හැර සහ ඔවුන් දෙනොගෙන් කෙනෙකු පැමිණ නොමැති අවස්ථාවක ඔහු වෙනුවට අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලැබූ සාමාජිකයකු ද ඉදිරියේ දී හැර එම මුද්‍රාව නොතැබීමට වගබලා ගැනීම ;

(ආ) අධ්‍යයන මණ්ඩලයේ හෝ අධ්‍යයන මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසුව නියෝග සෑදීම ;

(ඇ) අධ්‍යයන මණ්ඩලයේ හෝ අධ්‍යයන මණ්ඩලවල නිර්දේශ සලකා බැලීමෙන් පසුව, පරීක්ෂකවරුන් පත් කිරීම ;

(ඈ) අධ්‍යයන මණ්ඩලයේ උපදෙස් විමසා ආචාර්ය තනතුරු සහ වෙනත් ශාස්ත්‍රීය තනතුරු ඇති කිරීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම ;

(ඉ) (i) පවත්නා අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම සහ අලුත් අධ්‍යාපන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩල සංවිධානය කිරීම පිළිබඳ යෝජනා ක්‍රම, සහ

(ii) එක් එක් අදාළ අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩලවලට අධ්‍යයන විෂයයන් පැවරීම පිළිබඳව අධ්‍යයන මණ්ඩලයේ හෝ අධ්‍යයන මණ්ඩලවල වාර්තා ක්‍රියාත්මක කිරීම ;

(ඊ) රීජන්ට්ස් කවුන්සිලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කොන්දේසි මත, අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම ;

(උ) අවශ්‍ය යයි කළමනාකරණ සභාව සලකන යම් කමිටු සංඛ්‍යාවක් පත්කිරීම, ඒවායේ නිර්ණේය විෂයයන් නියම කිරීම, වාර්තා සළකා බැලීම හා වෙනස් කිරීම් සහිතව හෝ රහිතව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම ;

(ඌ) අධ්‍යයන පාඨමාලාවලට ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් රීජන්ට්ස් කවුන්සිලයට නිර්දේශ කිරීම ;

(එ) නියෝග මගින් අතුරු ව්‍යවස්ථා මගින් නියමිත වෙනත් යම් පරිපාලන කර්තව්‍ය ඉටුකිරීම සඳහා මධ්‍යස්ථානයට අනුයුක්ත කරන තැනැත්තන්ගේ පොදු සුභ සිද්ධිය හා පහසුකම් සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඒ) මධ්‍යස්ථානයේ දේපළ හා අරමුදල් දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ;

(ඔ) රීජන්ට්ස් කවුන්සිලයට නිශ්චිතව පවරා තිබෙන කාරණා සම්බන්ධයෙන් හැර, මධ්‍යස්ථානය සම්බන්ධ සියලු කාරණා, මෙම නියමාවලියේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව විධිමත් කිරීම සහ නිශ්චය කිරීම ;

(ඕ) නිශ්චිත කාර්ය සඳහා මධ්‍යස්ථානයේ කැමැත්ත පරිදි යොදා ගැනීම පිණිස ඇති යම් අරමුදලක් පරිපාලනය කිරීම ;

(ක) මධ්‍යස්ථානයේ කාර්ය සඳහා වන රික්ථවරණ, පරිත්‍යාග, දේපළ ප්‍රධාන, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පිළිගැනීම සහ භාරගැනීම ;

(ග) මිළ දී ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් චංචල හා නිශ්චල යන දෙයාකාරයේ ම දේපළ අත්හැර ගැනීම ;

(ට) එවැනි යම් දේපළක් මධ්‍යස්ථානය වෙත සතු කරනු ලැබූ නීතියෙන් හෝ යම් සාධන පත්‍රයකින් නියමිත යම් පරිසීමාකිරීම්, කොන්දේසි හෝ තහනම් කිරීම්වලට යටත්ව ඒ යම් දේපළ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් අන්සතු කිරීම ;

(ඩ) මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් සලකා බැලීම සහ ඒ වාර්තා සහ ගිණුම්, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ණ) මධ්‍යස්ථානයේ මුදල් ඇස්මේන්තු පිළියෙල කිරීම සහ එම ඇස්තමේන්තු, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ත) මධ්‍යස්ථානයේ කර්තව්‍ය කරගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, භූමිභාග, දැවභාණ්ඩ, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(ද) මධ්‍යස්ථානය විසින් සේවයේ නියුක්ත කරන තැනැත්තන් පත් කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම, ඔවුන් සේවයෙන් පහකිරීම හෝ අන්‍යාකරව ඔවුන්ගේ විනය පාලනය ;

(න) මධ්‍යස්ථානය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළත් වීම සහ මධ්‍යස්ථානයට අයත් නොයොදවා ඇති ආදායම් ඇතුළුව මධ්‍යස්ථානයට අයත් මුදල්, කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, භාර ආඥාපනතේ 20 වැනි වගන්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව, යම් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම.

12. (1) පරිපාලනමය සහ සංවිධානය පිළිබඳ කාරණාවලදී මධ්‍යස්ථානයේ කළමනාකරණ සභාවට, අධ්‍යක්ෂවරයාට සහ මධ්‍යස්ථානයේ නිලධරයන්ට උපදෙස් දීමේ කාර්යය සඳහා මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) කළමාකරණ කමිටුවේ බලතල සහ එහි කටයුතු කරගෙන යා යුතු ආකාරය, නියෝග මගින් හෝ අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි ය.

13. (1) අධ්‍යයන මණ්ඩලය විසින් යොමු කරනු ලබන කාරණා පිළිබඳව කළමනාකරණ සභාවට උපදෙස් දීමේ කාර්යය සඳහා මධ්‍යස්ථානයෙහි ශාස්ත්‍රීය කමිටුවක් විය යුතු ය.

(2) ශාස්ත්‍රීය කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) අධ්‍යක්ෂවරයා-ඔහු ශාස්ත්‍රීය කමිටුවේ සභාපති විය යුතු ය.

(ආ) එක් එක් අධ්‍යයන මන්ඩලයේ සභාපතිවරයා සහ එක් එක් මණ්ඩලයේ නාමිකයන් දෙදෙනෙක් ;

(ඇ) රිජන්ට්ස් කවුන්සිලයේ, ප්‍රත්‍යක්ෂ ශාස්ත්‍රීය විශිෂ්ඨතා සහිත සාමාජිකයන් තිදෙනෙක් ;

(ඈ) (අ) සහ (ඇ) අනුඡේදවල සඳහන් සාමාජිකයන් නොවන, කොමිෂන් සභාවෙන් නම් කරන නාමිකයන් තිදෙනෙක්.

14. (1) කළමනාකරණ සභාව විසින් විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර උප විෂය ක්ෂේත්‍ර සහ අන්තර් විෂය ක්ෂේත්‍ර සඳහා අධ්‍යයන මණ්ඩල, පිහිටුවනු ලැබිය යුතු ය. එහි අධ්‍යයන මණ්ඩලවල සංයුතිය, අතුරු ව්‍යවස්ථා මගින් නියමිත පරිදි විය යුතු ය.

(2) අධ්‍යයන මණ්ඩලයක සභාපතිවරයා, එක් එක් අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් විසින් තෝරා පත්කර ගත යුතු ය

(3) මේ නියමාවලියේ විධිවිධානවලට යටත්ව, අධ්‍යයන මණ්ඩලයක් විසින් පහත සඳහන් බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම සහ ඉටුකිරීම කළ යුතු ය.

(i) කළමනාකරණ සභාව විසින් යොමු කරන කවර හෝ කාරණා පිළිබඳව සලකා බැලීම සහ වාර්තා කිරීම

(ii) කළමනාකරණ සභාවේ පාලනයට යටත්ව, ඉගැන්වීම, විභාග සහ පර්යේෂණ පිළිබඳ කාරණා විධිමත් කිරීම

(iii) අධ්‍යයන මණ්ඩලවල පාඨමාලා සහ විභාග හා සම්බන්ධ සියලු කාරණා පිළිබඳව කළමනාකරණ සභාව වෙත නිර්දේශ කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීම

(iv) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් පිළිබඳව සලකා බලා වාර්තා කිරීමේ කාර්යය සඳහා, අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත්වන අනු කමිටු පත්කිරීම සඳහා නිර්දේශ කිරීම, ඒවායේ නිර්ණේය විෂයයන් නියම කිරීම සහ සාමාජිකයන් සඳහා දීමනා තීරණය කිරීම සහ

(v) පරීක්ෂකවරුන් ලෙස පත්කිරීමට යෝග්‍ය තැනැත්තන්, කළමනාකරණ සභාවට නිර්දේශ කිරීම.

15. පහත සඳහන් තැනැත්තන්, මධ්‍යස්ථානයේ නිලධරයන් විය යුතුය :-

(1) අධ්‍යක්ෂවරයා ;

(2) ලේඛකාධිකාරිවරයා ;

(3) මූල්‍යාධිකාරි ;

(4) පුස්තකාලයාධිපති ; සහ

(5) නියමාවලිය මගින් අනුමත කර තිබෙන වෙනත් යම් තනතුරක් දරන යම් තැනැත්තෙක්.

16. (1) (අ) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයා මධ්‍යස්ථානයේ පූර්ණකාලීන නිලධරයකු විය යුතු අතර, ප්‍රථම අධ්‍යක්ෂකවරයා, කොමිෂන් සභාව විසින් අවුරුදු තුනක ධූර කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතු ය. යම් අනුප්‍රාප්තික අධ්‍යක්ෂවරයෙකු, රිජන්ට්ස් කවුන්සිලය නිර්දේශ කරන නම් තුනක් අතරින් කොමිෂන් සභාව විසින් පත් කළ යුතුය. එසේ වුව ද, එම නම් බඳවා ගැනීමේ පටිපාටියක් මගින් නිර්දේශ කර තිබිය යුතු ය.

(ආ) කිසිදු තැනැත්තකු අනුක්‍රමික ධූර කාල දෙකකට වැඩි කාලයක් සඳහා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(ඇ) යථාපරිදි ධූරයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය අනුගමනය කර කොමිෂන් සභාව විසින් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඈ) අධ්‍යක්ෂවරයාට උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානියකුට සමාන තරාතිරමක් ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා, මධ්‍යස්ථානයේ ප්‍රධාන විධායක නිලධරයා ද ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයාද ප්‍රධාන ගණක නිලධරයාද, වන අතර, මධ්‍යස්ථානය තුළ විනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(3) නියමාවලියේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන යථාපරිදි බලාත්මක වන බවට වග බලා ගැනීම පිණිස නීත්‍යානුකූලව අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි විධාන ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය. තවද, ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට තිබිය යුතු අතර ඔහු විසින් ඒ බලතල ක්‍රියාත්මක කළ හැකි ය.

(4) අධ්‍යක්ෂවරයා නියමිත කාලයට කලින් ධුරය අත්හැරියහොත් හෝ 16(1) (ඈ) ඡේදය යටතේ ඉවත් කරනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දරන්නේ ය.

(5) අධ්‍යක්ෂවරයා නිවාඩු ලබා ගැනීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුට දවස් පහක් ඉක්මවන කාලයකට ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක එසේ කාර්යය ඉටුකිරීමට නොහැකි වීම සිදු වීමේ සිට දින හතක් ඇතුළත, ඒ ධුරයේ කාර්ය ඉටු කිරීම පිණිස යෝග්‍යයයි කොමිෂන් සභාව අදහස් කරන තාවකාලික වැඩ පිළිවෙලක් කොමිෂන් සභාව විසින් යොදනු ලැබිය යුතු ය.

(6) අධ්‍යක්ෂවරයා විශ්‍රාම ගතහොත්, ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුට මාස තුනක් ඉක්මවන කාල සීමාවක් ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වුවහොත්, එම ධුරය එම මාස තුන ඉකුත් වූ විට පුරප්පාඩු වී ඇති ලෙස සැලකිය යුතු ය.

(7) අධ්‍යක්ෂ ධුරයෙහි පුරප්පාඩුවක් ඇතිවුවහොත් මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධාන යටතේ එම ධුරයට ස්ථිරව තැනැත්තකු පත් කරන තෙක්, එම ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසුයයි කොමිෂන් සභාව සලකනු ලබන වැඩපිළිවෙලක්, එම පුරප්පාඩුව ඇති වී දවස් හතක් ඇතුළත කොමිෂන් සභාව විසින් යොදනු ලැබිය යුතු ය.

17 (1) මධ්‍යස්ථානයේ පූර්ණකාලීන නිලධරයකු වන ලේඛකාධිකාරිවරයා, බඳවාගැනීමේ පටිපාටියට සහ කොමිෂන් සභාව විසින් සාදන ලද රීතිවලින් නියමිත පත්කිරීමේ කාර්ය පටිපාටියට අනුකූලව, කළමනාකරණ සභාව විසින් පත් කරනු ලැබිය යුතු අතර ඔහු මධ්‍යස්ථානයේ වාර්තා සහ දේපළ භාරකාරත්වය සම්බන්ධයෙන් වගකිය යුතු ය. ඔහු මධ්‍යස්ථානයේ සහකාර ගිණුම් නිලධරයාද වන්නේ ය.

(2) ලේඛකාධිකාරිවරයා, අධ්‍යක්ෂවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව, මධ්‍යස්ථානයේ පොදු පරිපාලනය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය පාලනය පිළිබඳව වගකිව යුතු ය.

18 (1) මධ්‍යස්ථානයේ පූර්ණකාලීන නිලධරයකු විය යුතු මුල්‍යාධිකාරිවරයා, බඳවා ගැනීමේ පටිපාටියට සහ කොමිෂන් සභාව විසින් සාදන ලද රීතිවලින් නියමිත පත්කිරීමේ කාර්ය පටිපාටියට අනුකූලව, කළමනාකරණ සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) මුල්‍යාධිකාරිවරයා, ලේඛාධිකාරිවරයාගේ විධානයට සහ පාලනයට යටත්වන අතර මධ්‍යස්ථානයේ මූල්‍ය පරිපාලනය පිළිබඳව වගකිව යුතු ය. මධ්‍යස්ථානයේ අරමුදල්වල භාරකාරත්වය ඔහු විසින් දැරිය යුතු ය.

19 (1) මධ්‍යස්ථානයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු පුස්තකාලයාධිපතිවරයා, බඳවාගැනීමේ පටිපාටියට සහ කොමිෂන් සභාව විසින් සාදන ලද රීතිවලින් නියමිත පත්කිරීමේ කාර්ය පරිපාටියට අනුකූලව කළමනාකරණ සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) මූල්‍යාධිකාරිවරයා අධ්‍යක්ෂවරයාගේ විධානයට සහ පාලනයට යටත්වන අතර, මධ්‍යස්ථානයේ පුස්තකාලය පරිපාලනය සම්බන්ධයෙන් වගකිව යුතුය.

20 (1) මධ්‍යස්ථානය විසින් උපාධි ප්‍රදානය සඳහා සෑම වර්ෂයකටම වරක්, රීජන්ට්ස් කවුන්සිලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් දිනකදී හෝ දිනවල දී උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්විය යුතු ය : එසේ වුවද රීජන්ට්ස් කවුන්සිලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් අවස්ථාවකදී විශේෂ උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබිය හැකි ය.

(2) උපාධි ප්‍රදානෝත්සවයක ක්‍රියාවලිය අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය යුතු ය.

(3) ජනාධිපතිවරයා උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරිය යුතු ය. ජනාධිපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක කළමනාකරණ සභාවේ සභාපතිවරයා එම උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරිය යුතු ය.

21 (1) මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය මධ්‍යස්ථානයේ බලතල, කාර්ය හා කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාවේ යෙදීම හා ඉටුකිරීමට සඳහා අවශ්‍ය ලෙස සැලකෙන නිලධරයන්ගෙන් සහ වෙනත් සේවා නියුක්තයන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) මෙම නියමාවලියේ අන්‍යාකාරව විධිවිධාන සළස්වා ඇත්නම් මිස, මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය පත්කිරීම සම්බන්ධයෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ X වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල වන්නේ ය.

22. ලිත් වර්ෂය, මධ්‍යස්ථානයේ මුදල් වර්ෂය වන්නේ ය.

23. (1) මධ්‍යස්ථානයට "ජාතික මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන අරමුදල " යන නාමයෙන් එයටම අයත් (මෙහි මින් මතු "අරමුදල " යනුවෙන් සඳහන් කරන) අරමුදලක් තිබිය යුතු අතර, කවර හෝ ප්‍රභවයකින් ලැබෙන සියලු මුදල් එම අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(2) උචිත අය ශීර්ෂ යටතේ වර්ග කර ඇති පරිදි, සෑම කාර්තුවක් ඇතුළත අරමුදලට ගෙවනු ලැබූ සියලු මුදල් ප්‍රමාණවල සාරාංශයක් ඊළඟට එළඹෙන මාසයේ අවසානයට පෙර අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාවට එහි දැනගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

24. (1) රිජන්ට්ස් කවුන්සිලය විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකට හා ආකාරයට අනුව මධ්‍යස්ථානයේ ගිණුම් පවත්වාගෙන යන බවට වගබලා ගැනීම ;

(2) අරමුදලට ගෙවන සියලු මුදල් ලබාගැනීම සහ එම මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැර කිරීම ;

(3) අවසරලත් සියලු ගෙවීම් කිරීම ; සහ

(4) කොමිෂන් සභාව ඉල්ලා සිටින පරිදි වූ යම් ඇස්තමේන්තු සහ එළඹෙන වර්ෂයේ වාර්ෂික මූල්‍ය විසර්ජනය රිජන්ට්ස් කවුන්සිලය සඳහා පිළියෙල කිරීම

අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

25. (1) කොමිෂන් සභාව විසින් වරින් වර නිශ්චිතව නියම කරන යම් ආකෘතියකට සහ ආකාරයකට අනුව, මධ්‍යස්ථානය විසින් වාර්ෂික ගිණුම් ප්‍රකාශය සහ ස්වකීය ක්‍රියාකාරකම් පිළිබඳ සංඛ්‍යාලේඛන පිළියෙල කළ යුතු ය.

(2) මධ්‍යස්ථානයේ ගිණුම් පොත්, මධ්‍යස්ථාන කාර්යාලයේ තැබිය යුතු ය.

26. උසස් අධ්‍යාපන ආයතනවල ගිණුම් විගණනයට අදාළවන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මධ්‍යස්ථානයේ ගිණුම් විගණනය කෙරෙහි සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

27. මධ්‍යස්ථානයට සම්බන්ධ කවර හෝ කාරණයක් පිළිබඳව විධිවිධාන නියමාවලියේ ඇතුළත්ව නොමැති අවස්ථාවක, ඒ කාරණා සම්බන්ධව 1978 අංක 16 දරන පනතේ උචිත විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

28. මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වය සඳහා මූලික වැඩපිළිවෙල සකස් කිරීමේදී, අදාළ බලාධිකාර යථා පරිදි නිර්මාණය කරන තෙක් සහ අදාළ නිලධරයන් යථාපරිදි මෙම නියමාවලිය යටතේ පත් කරන තෙක් හෝ තෝරා පත්කර ගන්නා තෙක්, මධ්‍යස්ථානයේ යම් හෝ සියලු බලාධිකාරවල සහ නිලධරයන්ගේ සියලු බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම අධ්‍යක්ෂවරයා තමා විසින් ම කරනු ලැබිය යුතු ය.

29. මේ ආඥාපනතෙහි –

"පනත " යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ ;

"[illegible]ත්‍රය " යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුකූලව කරන ලද යම් නියමයන්, සාදන ලද නියමාවලියක්, අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් අදහස් වේ ;

"අමාත්‍යවරයා " යන්නෙන් උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

11-35/2